**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**

**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**

24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** 011 7920950, 0117920951**Fax:** 011 7920949
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

## 2010 පාර්ලිමේන්තු මහ මැතිවරණය

## මාධ්‍ය නිවේදනය අංක 02

2010 මාර්තු 20 දින 16.00වන පැයේදී

කොළඹ ශ්‍රී ලංකා, මාර්තු 20වන දින වන විට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට වාර්තා වූ සමස්ථ සිදුවීම් සංඛ්‍යාව 146කි.ඉන් සිදුවීම් 87ක් බරපතල සිදුවීම් ලෙස හඳුනාගෙන ඇත.ඉන් ගිනි අවි භාවිතා වූ සිද්ධීන් සංඛ්‍යාව 29කි.

මැතිවරණයට අදාළව ගත වූ පැය කිහිපය තුළ වාර්තා වූ ප්‍රචණ්ඩක්‍රියා කිහිපයක් පහත දැක්වේ.

**<u>මඩකලපුව එරාවුර්හිදී එජනිස ආධාරකරුවකුගේ ලොරි රථයකට ගිනි තැබීම.</u>**

මාර්තු 20වන දින අළුයම 12.30ට පමණ එ.ජ.නි.ස. ආධාරකරුවකු වන ඊබ්‍රහිම් රහිම්ට අයත් ලොරි රථය එරාවුර් ගාන්ධි පාරේදී නාඳුනන පිරිසක් විසින් ගිනි තබා ඇත.ඔහු විසින් මේ සම්බන්ධව එරාවුර් පොලිස් ස්ථානයට ECIB 29/10 යටතේ පැමිණිල්ලක් කර ඇත.

අදාළ ස්ථානයට ගිය මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක ඊබ්‍රහිම් මහතාගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත.තමන් එ.ජ.නි.ස. ආධාරකරුවකු බවත්, තමන්ගේ ලොරි රථය එ.ජ.නි.ස. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලට යොදාගත් බවත්, ඔහු මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂකට ප්‍රකාශ කර ඇත. මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂකට අනුව ලොරියේ ඉදිරිපස කොටස සම්පූර්ණයෙන් දැවී ගොස් ඇත.

එ.ජ.නි.ස. අපේක්ෂක අලි සහිර් මවුලානාගේ (අංක 02) කාර්යාලයේ නිළධාරියෙකු වන ඒ.සී.එම්.සෙයිඩ් මැ.ප්‍ර.නි.ම. ට ප්‍රකාශ කළේ, ඊබ්‍රහිම් මහතා පක්ෂයේ ක්‍රියාකාරී ආධාරකරුවකු වන අතර, ඔහුගේ ලොරිය එ.ජ.නි.ස. රැස්වීම් වලට භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගත් බවයි.

මෙවැනි සිදුවීමක් තමන්ටද වාර්තා වී ඇති බවත්, වැඩිදුර විමර්ශන සිදුවෙමින් පවතින බවත්, එරාවුර් පොලිසියේ ස්ථානාධිපති සී.පී.ඒ.එස්. පියරත්න මහතා මැ.ප්‍ර.නි.ම. වෙත පැවසීය.

**<u>පුත්තලම ආලන්කුඩාහිදී එ.ජා.ප. රථ පෙළකට පහර දීම</u>**

ශ්‍රී ල.මු.කො. ක්‍රියාකාරී කමිටු සාමාජික ඒ.එම්. හුසේන් ප්‍රකාශ කරන පරිදි මාර්තු 19වන දින ප.ව. 4.00ට පමණ ආලන්කුඩා "බී" කඳවුර අසළ පිහිටි එ.ජා.ප. පක්ෂ කාර්යාලයට නැවත පදිංචි කිරීම් හා ආපදා සහන සේවා නිලයේ සිටින අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් (අංක 01) මහතාගේ ආධාරකරුවන් පිරිසක් විසින් පහර දී ඇත. අදාළ පහරදීමෙන් එ.ජා.ප. ආධාරකරුවකු වන ජෙමිසිර්ගේ වම් අතට සුළු තුවාල සිදු වී ඇත.

ආලන්කුඩා කල්මුණායිකුඩි-බී ක්‍රීඩා පිටිය අසළදී ප.ව. 8.00ට පමණ තවත් පහර දීමක් එ.ජා.ප. රථ පෙළකට එල්ල වී ඇත. එ.ජා.ප. අපේක්ෂකයින් වන නූර්දීන් මෂූර් (අංක 05), ඒ.කේ.එස්. හමීතු (අංක 01) සහ එම්.එච්.

රිනෝස් (අංක 08) යන අය මෙම රථ පෙළෙහි ගමන් කරමින් සිට ඇති අතර, රිෂාඩ් බදුර්දීන් (අංක 01) මහතාගේ ආධාරකරුවන් පිරිසක් විසින් පහරදීම සිදුකර ඇත.වාහන 13ක් මෙම පහරදීමෙන් හානි වී ඇති අතර, අලාභය රු. 240,000ක් බව හුසේන් මහතා ප්‍රකාශ කර සිටියි.

ඒ.එම්. හුසේන් මහතා තවදුරටත් චෝදනා කර සිටියේ, විශේෂ කාර්යය බලකායද අදාළ සිද්ධියට සම්බන්ධ වී සිටි අතර ඔවුන්ද එ.ජා.ප. ආධාරකරුවන්ට පහර දී ඇති බවයි.

සිද්ධිය සම්බන්ධයෙන් අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් මහතාගෙන් විමසීමට උත්සාහ දැරුවද ඔහු සම්බන්ධ කරගත නොහැකි විය.

අදාළ සිද්ධිය පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීමට මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක මාර්තු 20වන දින කල්පිටිය පොලිස් ස්ථානයට ගියද පොලිසිය තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත. මැ.ප්‍ර.නි.ම. ප්‍රධාන කාර්යාලයද පොලිසියෙන් අදාළ සිදුවීම පිළිබඳව තොරතුරු ලබා ගැනීමට උත්සාහ කළද එය සාර්ථක නොවිය.

මැ.ප්‍ර.නි.ම..ට පුත්තලම දිස්ත්‍රික්කයෙන් සිදුවීම් 9ක් වාර්ථා වී ඇති අතර ඉන් 7ක්ම වාර්ථා වී ඇත්තේ කල්පිටිය පොලිස් බල ප්‍රදේශයෙනි. ඉන් එක සිදුවීමක් පමණක් පොලිසියට පැමිණිලි කර ඇත. සිදුවීම් දෙකකදී පැමිණිලිකරුවන් සෘජුව ප්‍රකාශ කර සිටියේ, පොලිසිය පවත්නා පාලන පක්ෂයට පක්ෂග්‍රාහී බැවින් තමන්ට පොලිසිය පිළිබඳව කිසිදු විශ්වාසයක් නොමැති බවයි.

<u>**හලාවත ප්‍රදේශයේ ඡන්දදායකයින් නොමඟ යවන බවට චෝදනා**</u>

ශ්‍රී ලංකා නිදහස් උපාධිධාරීන්ගේ සංගමයේ සභාපති ලෙස උදුල නුවන් පතිරණ විසින් අත්සන් කළ 2010 මාර්තු 05 වන දින දරන ලිපියක් හලාවත ප්‍රදේශයේ බෙදාහරින ලද බවට මාර්තු 20වන දින මැ.ප්‍ර.නි.ම. වෙත වාර්තා විය. රාජ්‍ය අංශයේ රැකියාවක් ලබා ගැනීමට ශ්‍රී ලංකා නිදහස් උපාධිධාරීන්ගේ සංගමයේ සහයෝගය බලාපොරොත්තු වන්නේ නම්, අවම වශයෙන් දින 20ක්වත් ගෙන් ගෙට සිදුකරන මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලට අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුබවට උපාධිධාරීන්ට දන්වා යවා ඇත.

මේ සම්බන්ධව මැ.ප්‍ර.නි.ම. උදුල නුවන් පතිරණගෙන් විමසූ විට මෙම චෝදනාව ප්‍රතික්ෂේප කළ ඔහු, හලාවත පොලිස් බල ප්‍රදේශය තුළ තමාගේ අත්සන වංචනිකව යොදා එවැනි ලිපියක් බෙදාහැර ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව එ.ජ.නි.ස. හලාවත ආසන සංවිධායක නියෝමාල් පෙරේරා දැනුවත් කර ඇති බව ඔහු තවදුරටත් පැවසිය. මේ සම්බන්ධව මැ.ප්‍ර.නි.ම. නියෝමාල් පෙරේරාගෙන් විමසූ විට, තමන් එවැනි ලිපියක් පිළිබඳව නොදන්නා බව ප්‍රකාශ කරන ලදී. තම පක්ෂය මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට සහභාගී වන අයට පමණක් රැකියා ලබා ගැනීමට උදව් කරන බවට තීරණය කර ඇතැයි යන චෝදනාව ඔහු විසිනුු තරයේ ප්‍රතික්ෂේප කරන ලදී.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |